**කැලණිය අධ්‍යාපන කලාපය**
**දෙවන වාර පරීක්ෂණය 2015**

# පෙරදිග සංගීතය

**6 ශ්‍රේණිය** **කාලය පැය ½ යි.**

## 1 කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. / සුමදුර / වේ s s s / මනහර / වේ s s s /

මෙම ශුද්ධ ස්වර ස්ථාපන ගී පාදයට අදාල වන ස්වර ප්‍රස්ථාර පේලිය වන්නේ,

(1) සසගග/රිරිග-/සසරිරි/ග---/

(2) සසස/රිරිරි /ග-රි/ස---/

(3) සරිගම/ප---/පමගරි/ස---/

(4) සසරිරි/ග-ම/සරිගම/පධප-/

02. මාත්‍රා 4ත් 4ට තාල බෙදෙන සරල ස්වර අභ්‍යාසයක මුල් පේලිය වන්නේ,

(1) සස/ගග/රිරි/මම/

(2) ස-ග/රි-ම/ග-ප/ම-ධ/

(3) සරිගම/ප-ප-/රිගමප/ධ-ධ-/

(4) සරිග/රිගම/ගමප/මපධ

03. සත්ත්ව සම් කම්පනය කිරීමෙන් හඬ උපදවනු ලබන අවනද්ධ භාණ්ඩයකි.

(1) තබ්ලාව (2) වයලීනය (3) සිතාරය (5) එස්රාජය

04. ළමා ගීතයක් ගායනයේදී නොගැලපෙන්නක් වන්නේ

(1) එහි මුල් ගායනයට හානියක් නොවන පරිදි ගායනා කිරීම.

(2) ගීතයට ගැලපෙන රංගයනයක්ද සමඟින් ගායනා කිරීම.

(3) උදෑසන පාසල් රැස්වීමේදී ප්‍රාසාංගිකව ගායනා කිරීම.

(4) බිම වාඩිවී ගායනා කිරීම.

05. මවක සහ පුතෙකු අතර ඇතිවන සංවාදයක් පරිද්දෙන් රචනාකර තිබෙන ළමා ගීතයකි.

(1) සෙන්පතියන් ගැන (2) ඉරෙන් හඳෙන්

(3) ආදර ඇයි පොඩි හඳ මාමේ (4) දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ

06. පාසල් ගීය හා ජාතික ගීය ගායනයේදී නොගැලපෙන්නකි.

(1) කට පාඩමින් ගායනා කිරීම.

(2) අභිමානවත්ව හා හැඟීම්බරව ගායනා කිරීම.

(3) බිම වාඩිවී සාමූහිකව ගායනා කිරීම.

(4) පද නිවැරදිව උච්චාරණය කරමින් නිවැරදි ශ්‍රැතිය මත පිහිටා ගායනා කිරීම.

07. අද වෙස්සන්තර රාජ පුතා, සුවඳ පත්ම ඕළු ආදි වැනි ගීත

(1) නව නාට්‍ය ගීතයි (2) නූර්ති ගීතයි

(3) සරල ගීතයි (4) ළමා ගීතයි

08. සරි සරිග, රිග රිගම, ............................ , මප මපධ.....

මෙහි හිස්තැනට ගැලපෙන ස්වර කාණ්ඩය වන්නේ,

(1) ගම ගමප (2) පම මගම (3) රිම ගරිස (4) ගරි සරිග

09. ලෝකයේ භාවිතවන සංගීත ක්‍රම දෙක වන්නේ,

(1) පෙරදිග සහ ඉංදීය (2) පෙරදිග සහ අපරදිග

(3) පෙරදිග සහ භාරතීය (4) බටහිර සහ භාරතීය

10. ගායනයේදී ස්වරයන්ගේ නියමිත නාදය උපදවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය එක් සාධකයක් වන්නේ

(1) ස්වසන අභ්‍යාසයි (2) වාදන අභ්‍යාසයි

(3) භාවනා අභ්‍යාසයි (4) ස්වර අභ්‍යාසයි

- 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත වරහන් තුළ ඇති වචන අතුරින් නිවැරදි වචනය තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න. (පෙරදිග, බටහිර, තබ්ලාව, වයලීනය, තානම)

11. C, D, E, F ආදී වශයෙන් සංකේතවත් වන්නේ ............................ ස්වර සංකේතයි.

12. ෂඩ්ජය, රිෂභය, ගාන්ධාරය ආදී වශයෙන් හඳුන්වන්නේ ............................ ස්වර නාමයයි.

13. BOW එකක ආධාරයෙන් වයනු ලබන පෙරදිග / අපරදිග සංගීත සම්ප්‍රදායන් දෙකෙහිම භාවිත වන සංගීත භාණ්ඩයකි ................................

14. කළගෙඩි සෙල්ලමේ ගීත ගායනයේදී කවියටපෙර ................................ ගායනා කරනු ලබයි.

15. ගායනයේදී හා වාදනයේදී තාලය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ................................ වාදනය කරනු ලබයි.

A කොටසට ගැලපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| 16. | ළමා ගීතයකි | සුවඳ පත්ම ඕලු ආදි |
| 17. | තූර්ති ගීතයකි | ජන ක්‍රීඩාවක් හා බැඳුණු ගීතයකි |
| 18. | කොච්චි කොටඤ්ඤං රළහමි දෙනවද එළුවා | ඉරෙන් හඳෙන් එළිය අරන් |
| 19. | එකට සතුටු සාගරේ | ආනන්ද සමරකෝන් මහතා |
| 20. | සුන්දර සිරි බරිනී සුරැදි අති සෝභමාන ලංකා | ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි |

(ලකුණු 01x20 = 20)

## 2 කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.

01. පහත ඇති වගුවේ හිස්කොටු සම්පූර්ණ කරන්න.

(i)

| පෙරදිග ස්වර නාමය | පෙරදිග ස්වර සංකේතය | අපරදිග ස්වර සංකේතය | අපරදිග ස්වර නාමය (ගායනයේදී) |
|---|---|---|---|
| ෂඩ්ජය | ස | | |
| | | D | රේ |
| ගාන්ධාරය | ග | | මී |
| මධ්‍යමය | ම | F | ෆා |
| පංචමය | | | |
| ධෛවතය | ධ | A | ලා |
| | නි | B | |

(ලකුණු 1/2 x 10 = 05)

(ii) පහත දී ඇති ස්වර අභ්‍යාස 2 න් එකක් තෝරාගෙන එහි ආරෝහන අවරෝහණ ලියා දක්වන්න.

- සරිග-/රිගම-/
- සරි සරිග/ රිග රිගම/

(ලකුණු 05)

02. (i) ස්වර පුවරුවක් ඇඳ එහි ශුද්ධ ස්වර 7 ලකුණු කරන්න.

(ii) ඔබ උගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක ගීත ස්වර ප්‍රස්ථාරය ලියා දක්වන්න.

(ලකුණු 10)

03. (i) ඔබ උගත් කෙළි ගීතයක් ලියන්න.

(ii) කෙළි ගී ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ගායනයේදී යොදාගත් සංගීත භාණ්ඩ | මෙම ගීත වැඩි වශයෙන් ජනප්‍රිය වූ කාලවකවානුව | ඔබ විසින් මෙම ගීත ප්‍රාසාංගිකව ගයා ඉදිරිපත් කරන අවස්ථාවක් | මෙම ගීත අනුසාරයෙන් දරුවන් තුළ වර්ධනයවූ යහපත් ගුණ ධර්මයක් |
|---|---|---|---|
| | | | |

(ලකුණු 10)

04. (i) වයලීනය, සිතාරය, ගිටාරය යන සංගීත භාණ්ඩ 03 න් එකක් තෝරාගෙන ඒ අසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සංගීත භාණ්ඩයේ නම | නාදය උපදින ආකාරය | ප්‍රධාන තත් ගණන | වාදනය කිරීම සඳහා උපයෝගී කරගන්නා උපකරණය |
|---|---|---|---|
| | | | |

(ii) බටනලාව, වයලීනය, ගිටාරය, යන සංගීත භාණ්ඩ තුනෙන් එකක් තෝරාගෙන එහි ස, රි, ග, ම, යන ස්වර 4 උපදින අයුරු රූප සටහන් මගින් ඇඳ පෙන්වන්න. (ලකුණු 10)

05. (i) ඔබ උගත් තූර්ති ගීතයක් ලියන්න.

(ii) තූර්ති ගීත සම්බන්ධව ඔබ දන්නා විශේෂ කරුණු 3 ක් ලියන්න. (ලකුණු 10)